**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - 2018**
**-----------------------------------------------------**

## 1.1 මතය ව්‍යාවනය

**------------------**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

## 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

**--------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය ව්‍යාවනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලටට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ සමුච්චිත අරමුදල වශයෙන් රු. 844,877,725 ක් හා ප්‍රාග්ධන සංචිත වශයෙන් රු. 4,407,578 ක් දක්වා තිබූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 95 ඡේදය ප්‍රකාරව, එම සංචිතවල ස්වභාවය හා අරමුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සමුච්චිත අරමුදල මගින් නිරූපනය වන්නේ මෙම ආයතනය ශ්‍රී ලංගම යටතේ පැවති කාල සීමාවේ එනම් 2005ට පෙර පැවති සියළු වත්කම් වල බැර ශේෂය වේ .ප්‍රාග්ධන සංචිත රු 4,407,578 අගය 2005 වසරේ දි රජයෙන් ලැබූ ප්‍රාග්ධන ප්‍රධාන වේ . | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ)(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේදී සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර තිබූ පොලී ආදායම රු. 4,044,048 ක් මෙහෙයුම් ලාභයට ගැළපීම් කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | නැවත ආයෝජනය කර තිබූ රු. 3,366,540ක්වූ පොලී ආදායම මුදල් ගලායාමක් ලෙස හා රු. 13,660,221 ක්වූ කාලීන තැන්පතු ආපසු ගැනීම් මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනම දැක්වීම වෙනුවට ශුද්ධ අගය වූ රු. 10,293,681 ක් දක්වා තිබුණි. | ආයෝජන වලින් ලද පොලිය වෙනමත් ,ආයෝජනය කල මුදල වෙනමත් ඇතුලත් කර 2019වසර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරන ලදි . | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (iii) | එකතුව රු. 3,975,757ක් වූ කෙටිකාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පත් පොලී ආදායම මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබුණු අතර කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ රු. 68,291ක්වූ ලැබිය යුතු පොලී ආදායමේ වෙනස ගලපා නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (iv) | වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු. 8,866,070 ක් වටිනා වත්කම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වත්කම් අත්පත් කරගැනීමක් ලෙස හා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් අනුචිත ලෙස දක්වා තිබුණි. | මෙම දෝෂය නිවැරදි කර ඉදිරි වර්ෂ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු එකතු පිරිවැය රු. 41,437,189 ක් වූ දේපල පිරියත හා උපකරණ තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | කාර්යාල උපකරණ ,ලී බඩු උපකරණ හා යන්ත්‍රෝපකරණ වල වටිනාකම ප්‍රත්‍යාගනනය කර ,එම වටිනාකම් පොත්වලට ගැනීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ.එම කාර්යය හැකි ඉක්මනින් අවසන් කර නිවැරදි වටිනාකම් ගිණුම්වලට ඇතුලත් කිරීමටත්, නැවත මෙම උපකරණ ක්ෂය කිරීම සඳහාත් කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9 හි 15 ඡේදයට අනුව තොග අගය කළ යුත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට වුවද ආයතනය විසින් තොග අගය කිරීමේදී පිරිවැය මත තොග අගය කර තිබුණි. | අමතර කොටස් තොගයේ ශුද්ධ උපලබ්ධි අගය වර්තමාන පිරිවැයට වඩා අඩු බව සදහන් කරමි. කුඩා කොටස් විශාල ප්‍රමාණයකින් සමන්විත අමතර කොටස්වල වෙළඳපොල අගය සොයාගැනීමට අපහසු බැවින් එම වටිනාකම ගිණුම්වලට ගැනීමට නොහැකි විය. තොගය තුළ භාවිතා නොවන අයිතම පවතින හෙයින්ද එම කොටස් පිළිවෙත් අනුව ඉවත් කිරීමටත් ඉතිරි කොටස් තොගයේ වටිනාකම නිවැරදි ලෙස ඉදිරිපත් කිරීමටත් පියවර ගනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂිකව ආයතනය විසින් මූල්‍ය කාර්යසාධන වාර්තාවේ දැක්වෙන ශුද්ධ මූල්‍ය අතිරික්තය හෝ ඌනතාවය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණත සමුච්චිත අතිරික්තය හෝ ඌනතාවය ලෙස වෙනම දැක්වීම වෙනුවට පරිවර්තන සංචිත (Translation Reserve) ලෙස අනුචිතව දක්වා තිබුණි. | 2019 වසර වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේදි මෙම දෝෂය නිවැරදි කර ශ්‍රී ල.රා.අ.ගි.ප්‍ර 01.සදහන් පරිදි සමුච්චිත අතිරික්තය /ඌනතාවය ලෙස දක්වා ඇත. | ශුද්ධ මූල්‍ය අතිරික්තය හෝ ඌනතාවය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණත වෙනම දැක්විය යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ජර්නල් වවුචර් | 734,130,951 | ජර්නල් වවුචර් 238 ක් | ජර්නල් සටහන් පොතක ජර්නල් සටහන් ලියනු ලැබේ. | ජර්නල් සටහන් සඳහා විධිමත් අනුමැතියක් සහිත ජර්නල් වවුචර් පිළියෙළ කළ යුතුය. |
| ණය ගැති ණය හිමි ශේෂ | 14,470,197 | ණයගැති හා ණය හිමි ශේෂ සනාථ කිරීම් | ණයගැති, ණය හිමි සඳහා ශේෂ සනාථ කිරීම් ලැබී නැත. | ශේෂ සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට රු. 657,330 ක වටිනාකම වූ අඩමාණ ණය වෙන් කිරීමෙන් පසු එකතුව රු. 2,746,816 ක් වූ ණයගැති ශේෂයක් වූ අතර ඒ තුළ වර්ෂ 10 ට වඩා පැරණි ණයගැති ශේෂය රු. 428,205 ක් සහ වර්ෂ 5 ත් වර්ෂ 10 ත් අතර ණයගැති ශේෂය රු. 1,097,929 ක් වූ අතර එම ණය අයකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් වලින් විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංගම බස්රථ අළුත් වැඩියාව සඳහා ශ්‍රී ලංගම ඩිපෝ වලින් අයවිය යුතු මුදල් වන අතර සිහිකැඳවීමේ ලිපි මගින් හිග මුදල් ගෙවන ලෙස දැනුවත් කර ඇත. පෞද්ගලික වැඩ ඇනවුම් අත්පිට මුදල මත පමණක් සිදු කිරීමටත් අයකර ගැනීමට නොහැකි ණයගැති ශේෂ පාලක මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ගිණුම් පොත් වලින් ඉවත් කිරීමටත් අවධානය යොමු වී ඇත. | ණය ගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, අයකර ගැනීම අවිනිශ්චිත ණය සම්බන්ධයෙන් අඩමාණ ණය ලෙස ප්‍රමාණවත් පරිදි වෙන්කිරීම් කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනත<br>(i) 12(1) වගන්තිය | මණ්ඩලයේ රැස්වීම් ,යටත් පිරිසෙයින් මාසයකට එක් වරක්වත් පැවැත්විය යුතු අතර රැස්වීම් සඳහා සනපූරණය පස් දෙනෙකු විය යුතුය. එසේ වුවද 2019 මැයි 31දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් 07දෙනෙක් පත් කර තිබුණද 2019 ඔක්තෝබර් 20 දින දක්වා රැස්වීම් පවත්වා නොතිබුණි. ආයතනය විසින් අවසාන වරට රැස්වීම් පවත්වා තිබුණේ 2018 සැප්තැම්බර් 28 දින වූ අතර ,අදාල කාල සීමාව තුළ ගැනීමට නියමිතව ඇති වැදගත් කළමනාකරණ තීරණ ගැනීම අතපසු වී තිබුණි .තවද ඒ හේතුවෙන් 2019 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ එකදු රැස්වීමක් හෝ පැවැත්වීමට නොහැකි වී තිබුණි. | 2019 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් නොකළ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොමැත. | පනතේ වගන්තියට අනුකූලව කටයුතු කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමෙන් පසුද රැස්වීම් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 17(5) වගන්තිය | අධ්‍යක්ෂ/විදුහල්පති ධූරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ස්ථිර පත්වීමක් සිදුකරන තෙක් අධ්‍යක්ෂ/ විදුහල්පති ධූරයේ කාර්යය ඉටුකිරීම සඳහා මණ්ඩලයේ සාමාජිකයකු තෝරාපත් කරනු ලැබිය හැකි වුවත් 2019 මැයි 07 දින සිට විශ්‍රාම ගිය ආයතනයේ අධ්‍යක්ෂ/ විදුහල්පතිවරයා 2019 මැයි 29 දින සිට කොන්ත්‍රාත් පදනමින් නැවත බඳවාගෙන තිබුණි. | 2018 සැප්තැම්බර් මාසයෙන් පසුව ආයතනයේ පාලන මණ්ඩලය රැස් නොවූ අතර ආයතනයේ පරිපාලන හා පුහුණු කටයුතු අඛණ්ඩව බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා අංක 057/115/1926/19දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ,විශ්‍රාම ගිය අධ්‍යක්ෂ - විදුහල්පති කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී. | ස්ථිර පත්කිරීමක් සිදුකරන තෙක් පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ආරම්භයේ සිටම ආයතනය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ආයතන සතු අතිරික්ත මුදල් භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව ස්ථාවර තැන්පතු, කාලීන තැන්පතු හෝ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය නොකළ යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනය විසින් ස්ථාවර තැන්පතු ලෙස රු. 24,836,310 ක් ද, භාණ්ඩාගාර බිල්පත් ලෙස රු. 10,788,555 ක් ද ලෙස එකතුව රු. 35,624,865 ක් ආයෝජනය කර තිබුණි. | ආයෝජන සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කල නමුත් ඒ සඳහා පිළිතුරක් නොලැබුණි. මෙම ආයෝජන ආයතනයේ ඵලදායි කාර්යන් සඳහා යොදවන ලෙසට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සහ අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදීද උපදෙස් දී ඇත. ප්‍රථම පියවර ලෙස රු. මිලියන 2 ක් බොරැල්ල ශාඛාවේ සංවර්ධන කාර්යයන්හි යෙදවීමට පාලක මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතෙහි 4 (ඌ) වගන්තිය | නියමිත ක්ෂේත්‍රවල තාක්ෂණ හා වෘත්තීය පුහුණු කිරීම් පවත්වාගෙන යාමේ සහ අධ්‍යාපනය ලබාදීමේ කාර්යය සඳහා කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම ආයතනයේ කර්තව්‍යයක් වුවද, ඒ අනුව කටයුතු කිරීම සඳහා ආයතනය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එය ඉටු කිරීමේ දී ආයතනයේ පුහුණු පාඨමාලාවල ගුණාත්මක භාවය ඒ අයුරින්ම පවත්වාගෙන යාමට හැකිවන අයුරින් කටයුතු කල යුතුවේ .<br>මීට පෙර ආරම්භ කරන ලද ස්ථානවල තිබූ සියළු ශාඛා ඵලදායි නොවුනේ එම ස්ථාන වල පැවති නොයෙකුත් අඩුපාඩුකම් නිසාය. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 16,857,775 ක අතිරික්තතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 58,149,391 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 129 කින් හෙවත් රු. 75,007,166 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්ථන රාජ්‍ය ප්‍රදාන රු. 29,475,000 කින් වැඩිවීම හා විලම්භිත ආදායම් රු. 52,205,982 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේදී රු. 3,586,990 ක් වැයකර සේවා පරිගණකයක් හා නව පරිගණක ජාලය ස්ථාපිත කිරීමට අදාල අනෙකුත් උපකරණ ප්‍රසම්පාදනය කර තිබූ අතර, 2019 සැප්තැම්බර් වන විටද අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් සඳහා පරිගණක ජාල ස්ථාපිත කිරීමකින් තොරව අන්තර්ජාල පහසුකම් සපයාගැනීම පමණක් සිදුකර තිබුණි . | අදාල සේවා පරිගණකය සම්බන්ධව අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුගේ පිරිවිතර ආයතනයේ අවශ්‍යතාවය අනුව ඉල්ලුම් කරන ලද පිරිවිතර සමඟ නොගැලපෙන බව තාක්ෂණික කමිටු වාර්තාව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය කරන ලදි . | පරිගණක ජාලය ස්ථාපිත කිරීමෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටුකරගත යුතුය. |
| (ආ) මාර්ග සංවර්ධන අධිකාරිය සතු ඉඩමක ආයතනය වෙනුවෙන් මහල් 06 කින් යුත් ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිකිරීමේ කටයුතු 2018 නොවැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණද 2019 සැප්තැම්බර් 30 දින වන විටත් අදාල ගොඩනැගිලි සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරවා ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද, මෙම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) දිගු කාලයක සිට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පවත්වාගෙන යනු ලබන වටිනාකම රු. 1,149,350,000ක් වූ ඉඩම පවරා ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. | මෙම ආයතනය ශ්‍රී ලංගම ආයතනය යටතේ පැවති ආයතනයක් බැවින් ආයතනය සතු ඉඩම් වල ඔප්පු එම ආයතනය සතුව තිබේ. | ආයතනයට අදාල වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ 05 තුළ පූර්ණ කාලීන පාඨමාලා සඳහා මූලික සුදුසුකම් සපුරා තිබූ අයදුම්කරුවන්ගෙන් ඇතුළත් කර ගනු ලැබූ ප්‍රතිශතය සියයට 20 ත් සියයට 30ත් අතර වූ අතර වාර්ෂිකව වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි ආයතනයේ ධාරිතාව වැඩි කර ගැනීම සඳහා නිසි සැලැස්මකින් යුතුව කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් අයදුම්කරුවන් 3,075 දෙනෙකුට පාඨමාලා හැදෑරීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | වර්තමානයේ පාඨමාලා සඳහා ශිෂ්‍ය සහභාගිත්වය වෙනුවෙන් වැඩි ඉල්ලුමක් පැවතිය ද 2016වසරේ සිසුන් 600දක්වා වැඩිකරන විට ,සිසුන් 400ක් සඳහා පැවති ඉඩකඩ ඒ අයුරින් භාවිතයට ගැනීමට සිදු විය . එසේම කාර්ය මණ්ඩලයේ සිටින උපදේශකවරුන් ප්‍රමාණවත් නොවන බැවින් පුහුණු උපදේශකවරුන් 20 දෙනෙකු තාවකාලිකව කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා බඳවා ගෙන ඇත. වැඩිවන ඉල්ලුමට | ආයතනයේ ධාරිතාව වැඩිකර ගැනීම සඳහා නිසි සැලැස්මකින් යුතුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා නව වැඩහල්, පන්තිකාමර හා පරීක්ෂණාගාර ඉදිකිරීම් අරමුණින් ආයතනයට යාබද, නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 4ක් පමණ වූ භූමි භාගය ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කෙරෙමින් ඇත. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ උපදේශක දීමනා ගෙවීමේදී 2017 මාර්තු 23දිනැති අංක 1/1/39/6දරන නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය සමග ඉදිරිපත් කරන ලද දීමනා සඳහා වන ආකෘති පත්‍රයේ සඳහන් නිර්ණායක 03ක් සාවද්‍ය ලෙස අර්ථකථනය කොට ගෙවීම් සිදුකර තිබූ බව 2018 පෙබරවාරි සිට අප්‍රේල් මාසය දක්වා කාලපරිච්ඡේදයට අදාලව සිදුකරනු ලැබූ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද ,ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 4.3 අ ඡේදය මගින් මේ පිළිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද අදාල නිවැරදි කිරීම් කරගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ උපදේශක දීමනා ගෙවීමේදී 2018 පෙබරවාරි මස සිට අප්‍රේල් මාසය දක්වා කාලයේදී සිදු වී ඇති අතපසුවීම් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | සාවද්‍ය ලෙස අර්ථකතනය කොට සිදුකරන ලද ගෙවීම් අයකරගත යුතුය. |
| (ආ) මුලා ප්‍රකාශන තුළ ඇතුලත් අමතර කොටස් තොගය තුළ එකතු වටිනාකම රු. 432,252 ක් වූ අයිතම 135 කට අදාල ඒකක 11,594 ක් වර්ෂ 3 සිට වර්ෂ 20කට අධික කාලයක් නිකුත් නොකර ගබඩාවේ පැවතුණි. | ආයතනය සතු වාහන අළුත්වැඩියා කටයුතු සඳහා භාවිතා කිරීමට මෙම අමතර කොටස් තොගය පවත්වාගෙන යනු ලැබේ. මෙම අමතර කොටස් තොගය තුල ඇති භාවිතා නොවන අමතර කොටස් හඳුනාගෙන ඉවත් කල පසු මෙම ගැටළුව ඇති නොවන බවත් සඳහන්කරමි. | ආයතනය තුළ මනා තොග පාලන පද්ධතියක් පවත්වා ගත යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ට අනුව 2006 ,ජනවාරි 01 දිනට සිදුකර තිබූ වැටුප් පරිවර්තනයන්ට අදාලව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ 2008 සැප්තැම්බර් 29 දිනැති අංක DMS/C/1/PS/34 දරන ලිපියේ 2ඡේදයේ සඳහන් උපදෙස්වලට පටහැනිව පෙර උපයා තිබූ වැටුප් වර්ධක නැවත ලබා දෙමින් 2008 ජූලි 01 දිනට සේවක මණ්ඩල අන්තර්ග්‍රහණය සිදු කර තිබූ බව නිලධාරීන් 32 දෙදෙනෙකුට අදාලව අභ්‍යන්තර විගණනය විසින් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය කර තිබුණි. එහිදී අන්තර්ග්‍රහණය කිරීමේදී වැටුප් වර්ධක 01 සිට 16 දක්වා වැඩියෙන් ලබාදී තිබීම හේතුවෙන් එම නිලධාරීන්ට 2016 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු. 1,504,100 ක් වැඩියෙන් ගෙවා තිබූ බවත් විගණනයට නිරීක්ෂණය විය. සාවද්‍ය ලෙස නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම නිවැරදි කිරීමට 2019 ඔක්තෝබර් 30 දින දක්වාම අපොහොසත්වී තිබුණි. | පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාවද දැනුම් දී ඇත්තේ රේඛීය අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ජාතික වැටුප් කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙම ආයතනයට ගැලපෙන විශේෂ වැටුප් ක්‍රමයක් අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසය. ඒ අනුව රේඛීය අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා ඉල්ලීමක් කර ඇත. | සාවද්‍ය ලෙස නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 2.9.1 මාර්ගෝපදේශය සඳහා රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් 2017 මාර්තු 01 දින ඉදිරිපත් කරන ලද 32වන අතිරේකය අනුව ප්‍රසම්පාදන කටයුතු වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ සහ සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කරනු ලැබීමේදී ප්‍රසම්පාදන රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් නිලධාරීන්ට කරනු ලබන ගෙවීම් අදාල කරනොගත යුතු අතර කිසිදු ගෙවීමක් නොකළ යුතුය. එයට පටහැනිව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ වූ ප්‍රසම්පාදනයන් 05 කට අදාලව කමිටු සාමාජිකයන්ට සහ අනෙකුත් නිලධාරීන්ට 2017 සහ 2018 වර්ෂයන් වෙනුවෙන් එකතුව රු .35 250,ක් ගෙවා තිබුණි. | මිල සැසඳුම් ක්‍රමය භාවිතා කල ප්‍රසම්පාදන කාර්යයන් වල කමිටු සාමාජිකයින්ට ගෙවූ දීමනා ආපසු අයකර ගැනීම සඳහා පියවර ගෙන ඇත. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 04 ක් ද ඇතුළුව තනතුරු 30 ක් පුරප්පාඩුව පැවති අතර 2020 ජුනි 10 දින වන විටද එම ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරුද ඇතුළුව තනතුරු 23ක් පුරප්පාඩු වී පැවතුණි .ඒ අනුව , එම තත්ත්වය ආයතනයේ කටයුතු සාර්ථක ලෙස පවත්වාගෙන යාමට අහිතකර ලෙස බලපානු ලැබිය හැකි බව නිරීක්ෂණය විය. | වර්තමානයේ 2020.02.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2017අංක 15දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය පනතේ (1) 17හා 17 (5)වගන්ති වලට අනුව අධ්‍යක්ෂ -විදුහල්පති ධුරයට ස්ථිර පත්වීමක් සිදු කරන තෙක් එහි කාර්ය ඉටු කිරීම සඳහා පාලන මණ්ඩල සාමාජිකයෙකු වන උපාලි රණසිංහ මහතා පත් කර ඇත.<br><br>විශ්‍රාම යාම ,ඉල්ලා අස්වීම යන හේතු මත 2019.09.30 දින වන විට තනතුරු 10 ක නිලධාරීන් 14 දෙනෙකු සඳහා බඳවා ගැනීමට අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර 2019.09.30 වන විට අනුමැතිය ලැබී නොමැත. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2016 සහ 2017 වර්ෂයන්ට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තා 2019 ඔක්තෝබර් 24 දින වන විටද පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අපොහොසත් වී තිබුණි. | 2016 හා 2017 වාර්ෂික වාර්තා පිළියෙල කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට පිළිවෙලින් 2019.06.24 දින හා 2019.08.08 දින අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදි. | නියමිත දින වලදී වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය මගින් 2018 ජනවාරි 01 දින සිට 2019 ජුනි 30 දින දක්වා අභ්‍යන්තර විගණන විමසුම් 11 ක් කළමනාකරණය වෙත ඉදිරිපත් කර තිබුණද 2020 ජුනි 10 වන විට විගණන විමසුම් 04 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබු විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | නියමිත දිනයන්හි විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වන විට සිය සංවිධානයට අයත් සියළුම රටවල ආර්ථික සංවර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - "2030 හඳුන්වා දී ඇති අතර, එය සියළු සාමාජික රටවල් විසින් ක්‍රියාත්මක කළ යුතු විශ්වීය ප්‍රකාශයක් වේ .ඒ අනුව ,ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විසින් මෙම න්‍යාය පත්‍රයට අනුකූලව තම ආයතනයට ගැළපෙන අරමුණු 04ක් හඳුනාගෙන තිබුණද ඉන් අරමුණු තුනක් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ඉලක්ක හඳුනාගෙන නොතිබුණි . | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ශාත් කර ගැනීම සහ සියළුම කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම සඳහා ජාතික නීති රීති වලට අනුකූලව කාන්තාවන්ට ආර්ථික සම්පත් සඳහා සමාන අවස්ථාව ලබා දීම සහ ආයතනයේ පාඨමාලා සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයේම අධුනික ආධුනිකාවන් බඳවා ගැනීම සඳහා කටයුතු කරන ලදී. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |